ශ්‍රී. බු. ව. 2553 බක් මස කලාපය, රා. ව. 2010 ක් වූ
මාර්තු 29 වන දින

මාතර, ශ්‍රී සුදර්ශී මහ පිරිවෙන්හි නියෝජ්‍ය පරිවෙනාධිපති
දෙව්නුවර, කපුගම, සුධර්මාරාමාධිපත

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම සුගතසාර ස්වාමීන්වහන්සේ
විසිනි

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස ඥ ඥ ඥ

චංචල ලෝකය තුළ නිශ්චල නිගමනවලට නොඑළඹ ජීවිත
සරුකර ගනිමු.

(ධම්ම පදය මාර්ග වර්ගය)

පින්වත්නි, www.lakruhunu.com

අද බක් පුර පසළොස්වක පොහොය දිනයයි. ගස් වැල් පරණ කොළ ඉවත ලා අලුත් දළුවලින් එළ අපේක්ෂාවෙන් සිටින භාග්‍යවන්ත මාසය යි. මේ භාග්‍යවන්ත මාසයේ යෙදෙන පොහොය දිනයෙහි මෙම සදහම් පණිවිඩයෙන් අප බලාපොරොත්තු වන්නේ චංචල ලෝකය තුළ නිශ්චල නිගමනවලට නො එළඹ තම ජීවිත භාග්‍යවන්ත ජීවිත ලෙසට පත්කරවීමයි. නවගුණ පාඨයෙහි සඳහන් බුදුගුණ අතර භගවා නමින් බුදුගුණයක් විස්තර වෙයි. එයින් අදහස් කරන්නේ තථාගතයන්වහන්සේගේ ජීවිතය භාග්‍යවන්ත ජීවිතයක් බවයි. තම ජීවිතය භාග්‍යවන්ත කරගත් තථාගතයන් වහන්සේ අපට ධර්මය දේශනා කළේ අපේ ජීවිතත් භාග්‍යවන්ත කරලීම සඳහායි.

එම භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ දෙවනවර, ශ්‍රී ලංකාවේ නාගදීපයට වැඩම කළේ අද වැනි බක් පුර පසළොස්වක පෝය දිනයකය . එසේ වැඩම කළ බුදුන් වහන්සේට මණී අක්ඛිත නම් නා රජතුමා විසින් කැලණියට වැඩමකරවන ලෙසට ආරාධනා කළේ ද අද වැනි පෝය දිනයක ය. මෙසේ බුදුන්වහන්සේ ලංකාවට වැඩම කොට ලාංකිකයින්ගේ තිබූ පැරණී අදහස් ඉවතලා අලුත් අදහස් ඇති කිරීමට ගත් උත්සාහය නිසා අපිද භාග්‍යවන්ත පිරිසක් බවට පත් උනෙමු.

අද මෙම දහම් පත්‍රිකාවෙන් බලාපොරොත්තු වන්නේ තථාගතයන් වහන්සේ සමාජයට ඉදිරිපත් කළ නව චින්තනය හඳුන්වා දීමය. පහත සඳහන් කරන ලද ගාථා තුන සඳහන් වන්නේ ධමමපද පාලියේ මාර්ග වර්ගයේය. එම නිසා ගාථා තුනෙහි අදහස මුලින්ම දැනගත යුතුය.

01. „සබෙබ සංඛාරා අනිචචාති යදා පඤඤාය පසසති . අථ නිබබින්දති දුකෙඛ එස මගෙගා විසුදධියා.❑❑

සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍යය යි. යමෙකු නුවණින් දකීද ඔහු දුකෙහි කළ කිරේ. එය පිරිසිදුවීමේ මගයි.

02. „සබෙබ සංඛාරා දුකඛාති යදා පඤඤාය පසසති . අථ නිබබින්දති දුකෙඛ එස මගෙගා විසුදධියා. ❑❑

සියළු සංස්කාර ධර්මයෝ දුකයයි. යමෙකු නුවණින් දකීද ඔහු දුකෙහි කළ කිරේ. එය පිරිසිදුවීමේ මගයි.

03.„සබෙබ ධමමා අනතතාති යදා පඤඤාය පසසති . අථ නිබබින්දති දුකෙඛ එස මගෙගා විසුදධියා.❑❑

සියලු ධර්මයෝ අනාත්මයයි යමෙකු නුවණින් දකී ද ඔහු දුකෙහි කළ කිරේ. එය පිරිසිදුවීමේ මගයි.

අප මුලින් සඳහන් කළ නව චින්තනය යනු මෙම ත්‍රිලක්‍ෂණ ධර්මය යි. එදා භාරතයේ පැවැතුනේ නිත්‍ය, සුඛ, ආත්ම යන පදනම මත පිහිටි ආත්මවාදී චින්තනය කි. වෛදික, බ්‍රාහ්මණ, ආරණ්‍යක හා උපනිෂද් යන යුගවල ඒ ඒ චින්තකයින් ආත්මවාදය ස්ථිර කිරීම සඳහා නොගත් උත්සාහයක් නැත. ඔවුන් කියන පරිදි මේ ලෝකය නිර්මාණය කරන ලද මහා බ්‍රහ්ම ලඟ ඇත්තේ විශ්වාත්මය හෙවත් ජගදාත්මය යි. එම ප්‍රධාන ආත්මය විසින් අනෙක් පුද්ගලයින්ට දී තිබෙන ආත්මය පුද්ගලාත්මය හෙවත් ප්‍රත්‍යගාත්මය යි . යම් දිනෙක පුද්ගලයා මිය ගිය පසු එම කුඩා ආත්මය ප්‍රධාන ආත්මය සමග එකතුවෙයි.

ආත්මවාදී චින්තකයින් කියන්නේ චංචල ලෝකය තුළ කිසියම් නිශ්චල පදාර්ථයක් තිබෙන බවය. ඔවුන් එය හඳුන්වන්නේ ආත්මය හැටියට යි. අද ලංකාවේ පවත්නා ක්‍රිස්තියානි මුස්ලිම්, හින්දු යන ආගම් ද ඉහතකී ආත්මවාදී චින්තනය ගරු කරන ආගම්ය . කිතු දහමේ සදාකාලික දෙවි කෙනෙක් ගැන කථා කරයි. මුස්ලිම්, ආගමද සාදාකාලික දේවත්වයක් ගැන විශ්වාස කරයි. හින්දු ආගමේ සදාකාලික ආත්මයක් ගැන උගන්වයි. ඒ නිසා මේ සියලු ආගම් ආත්මවාදී ආගම් ය.

අප විශ්වාස කරන බුදු දහම කියන්නේ චංචල ලෝකය තුළ එවැනි නිශ්චල කිසිවක් නැති බවයි. ඒ නිසා බුදු දහම අනාත්ම වාදී චින්තනයකි. මෙම අදහස ඉතාම පැහැදිලිව ප්‍රකාශ වන තැනක් හැටියට ධමම පදයේ මාර්ග වර්ගයේ එන ඉහත සඳහන් ගාථා 3 දැක්විය හැකිය. එහි පළවන හා දෙවන ගාථාවල සියලු සංස්කාරයෝ අනිත්‍ය බවත්, දුකඛ බවත් දක්වා තුන් වන ගාථාවේදී සංඛාර යන වචනය වෙනුවට සබෙබ ධමමා යන වචනය යොදා තිබේ. එය සැලකිල්ලට ගත යුතු තැනකි. යම් හෙයකින් 03 වෙනි ගාථාවටත් සබෙබ සංඛාරා කියා යොදා තිබුනානම් මහත් ගැටලුවකට මුහුණ දීමට සිදුවෙයි.

ආත්මවාදී චින්තනයකින් නිතරම උත්සාහකරන්නේ බුදු දහම තුළ නැති ආත්මවාදයක් ඇතිකර පෙන්වීමටය. ඒ නිසා ඔවුන් අපෙන් මෙසේ ඇසිය හැක. සියළු සංස්කාර ධර්මයෝ අනිත්‍ය බවත්, දුකඛ බවත්, අනාත්ම බවත් අපිද පිළිගනිමු. ඒ පිළිබඳව අපේ කිසිදු වාදයක් නැත. නමුත් තුන්වන ගාථාවට අනුව සියලු සංස්කාර ධර්ම අනාත්මය යි. අපි ද පිළිගනිමු. එම සංස්කාර යන පදයට ඔබලාගේ නිවන අයිති නැහැ නේද? එවිට ඔව් කියා පිළිතුරු දෙන්නට අපට සිදුවෙයි. එවිට ඔවුන් අපෙන් මෙසේ ඇසිය හැක. එසේනම් ඔබලා විශ්වාස කරන නිවන යනු ආත්මය ද? එවිට අපිට පිළිතුරු නැතිවෙයි. ඒ න්‍යාය බුදුන්වහන්සේ

තුන්වන ගාථාවේදී සබෙබ ධමමා යන වචනය යොදා නිවනත් ඊට ඇතුළත් කළේ සබෙබ ධමමා අනතතා යන මෙහි ''ධම්මා'' යන වචනයට නිවනත් ඇතුළත් යයි පිළිගැනීමට සමහරු බිය වෙති. ඒ අය කියන්නේ යදනිචචං තං දුකඛං යං දුකඛං තදනතතා යන පාඨයට අනුව යමක් අනිත්‍ය නම් එය දුකකි. යමක් දුක් නම් එය අනාත්මය. නිර්වාණය අනාත්ම කියා ගතහොත් නිවන දුකට ඇතුළත් වේය කියා තර්ක කරති. මෙය වැරදි තර්කයකි. දුක්වූ සියල්ල අනාත්මය යි කීමෙන් අනාත්ම වු සියල්ලල දුක් යයි කිසි සේත් නොකියවෙයි කාටත් තේරෙන සාමාන්‍ය උදාහරණයක් ගෙන බැලුවිට මේ තර්කයේ වරද හෙළි වෙයි. සියලුම සිංහලයෝ මනුෂ්‍යයෝය. ඒ නිසා සියලුම මනුෂ්‍යයෝ සිංහලයෝයයි කීවොත් එය වැරදි තර්කයකි. මනුෂ්‍ය යන වචනයට සිංහල, දෙමළ, මුස්ලිම් ආදී විවිධ ජාතීන් අයත්වන බැවිනි. ඒ නිසා අනාත්ම යන වචනයට දුකවූ සියල්ල මෙන්ම දුක් නොවූ සියල්ලද ඇතුළත් වෙයි. දුක් නොවූ එකම දෙය නිවනයි.

බුදුරජාණන් වහන්සේ ප්‍රථම ධර්ම දේශනාව පවත්වමින් බරණැස ඉසිපතන නම්වු මිගදායේදී පස්වග තව්සන්ට දේශනා කළේ ''යං කිඤ්චි සමුදය ධමමං සබබං තං නිරෝධ ධමමං'' යනුවෙන් හේතු ප්‍රත්‍යයෙන් ඇතිවු සියල්ල නැතිවෙන බවයි. එවැනි විශ්ව සාධාරණ අනිත්‍යතාවයක් වෙනත් කිසදු දහමක උගන්වා නැත. එහිදී මුලින්ම කොණ්ඩඤ්ඤ තාපස තුමා අවබෝධ කරගත්තේ චංචල ලෝකය තුළ නිශ්චල කිසිවක් නැති බවය. ඒ භාග්‍යවන්ත පණිවිඩය

තම ශිෂ්‍යයෙක් මුලින්ම අවබෝධකර ගත් නිසා තථාගතයන්වහන්සේට ඇතිවූ සතුට ප්‍රකාශ කළේ ''අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤෝ අඤ්ඤාසි වත හො කොණ්ඩඤ්ඤෝ'' යනුවෙනි. කොණ්ඩඤ්ඤ ඔබ ඥානවන්තය යනු එහි තේරුම යි. නමුත් අනෙක් 4 දෙනාට මේ බව තේරුම් ගැනීමට නොහැකි වු

නිසා පඤ්චවගගිය සූත්‍රය හෙවත් අනතත ලකඛණ සූත්‍රය දේශනා කළ සේක . එහිදී රූප වේදනා සඤඤා, සංඛාර විඤඤාණ යන උපාධාන ස්කන්ධ 5 ත්‍රිලක්‍ෂණයට නගමින් ප්‍රශ්නෝත්තර ක්‍රමයට කළ දේශනාවෙන් එම හතර දෙනා ද අවබෝධ කර ගත්තේ චංචල ලෝකය තුළ නිශ්චල නිගමනයකට එළඹිය නොහැකි බවයි. ඒ තුළින් ඒ හතර දෙනාද භාග්‍යවන්තයින් පිරිසක් විය.

තත්වය මෙසේ වුවත් ආත්මවාදී චින්තනයෙහි ඇලී ගැලී සිටිනා අය බුදු දහම තුළත් ආත්මවාදයක් දැකීමට උත්සාහ කරති. බුදුන්වහන්සේ දවස ජීවත් වූ සාති නම් භික්‍ෂුව භවයෙන් භවයට නොවෙනස්ව ගමන් කරන විඤ්ඤාණයක් ඇතැයි කියා සිටියහ. '' තදෙවිධං විඤඤාණං සනධාවති සංසරති අනඤඤං '' යනුවෙන් කළ එම ප්‍රකාශයේ අදහස එකම විඤඤාණය නොවෙනස්ව භවයෙන් භවයට ගමන් කරනා බවයි. මෙහිදී සාති භික්‍ෂුව චංචල ලෝකය තුල විඤඤාණය නිශ්චල දෙයක් බව ප්‍රකාශ කළහ. තථාගතයන් වහන්සේ සාති භික්‍ෂුව කැඳවා හිස් පුරුෂයා යනවචනයෙන් ආමන්ත්‍රණය කොට ඔබට මේ ශාසනයේ උණුසුමවත් වැදී නැති බව දේශනා කරමින් එම ආත්මවාදී චින්තනය ප්‍රතික්‍ෂේප කළ සේක.

බුදුදහම තුළ නැති ආත්මවාදයක් ඇතිකිරීමට වෙරදරණ අය පෙළ දහමේ එන සූත්‍ර පාඨ ඉදිරිපත් කරමින් ගන්නා උත්සාහයද මඳක් සිහිපත් කරගත යුතුයි. ධමමපදයේ අතත වගගයේ එන ''අතතාහි අතතනෝ නාථො'' යන පාඨය ඉදිරිපත් කරමින් ආත්මය ආත්මයාගේ නාථයායයි තේරුම් කර දෙයි. ඔවුන් එයින් ප්‍රකාශ කරන්නේ පරමාතමය කුඩා ආත්මයාගේ ස්වාමියා කියාය. මෙය වැරදි පරිවර්තනයකි. පාළි භාෂාවේ සඳහන් වන ''අතත'' ශබ්දයෙන් කිය වෙන්නේ තමා ගැනයි. නාථ යනු ස්වාමියා නොව පිහිට උදව්ව ආධාරය යනු වේ. ඒ අනුව තමාම පිහිට තමාය යනු එහි අදහසයි. අතත ශබ්දය සමහර තැන්වල ආත්මය

ගැන ප්‍රකාශ කරන්නටත් යොදාගෙන තිබේ. නමුත් මේ තැන එවැනි අර්ථයක් ගත නොහැකිය.

දීඝ නිකායේ මහා පරිනිබ්බාණ සූත්‍රයේ එන ''අතතදීපා විහරථ අතත සරණා අනඤ්ඤ සරණා '' යන පාඨය ඉදිරිපත් කරමින් ඔවුන් කියන්නේ ආත්මය පහණක් කොටගෙන ආත්මය සරණ කොට ගෙන වෙන කෙනෙකු සරණකර නොගෙන ජීවත්වන්න කියායි. එවැනි අදහසක් ඒ දේශනාව තුළ නැත. මෙහි නිවැරදි අදහස නම් තමා දිවයිනක් හෙවත් ද්වීපයක් (පිහිටක්) කරගෙන තමාම තමාට සරණකරගෙන වෙන කෙනෙකු සරණ කර නොගෙන ජීවත්වන්න කියාය. නමුත් සෙලවෙන ලෝකය තුළ නොසෙල්වෙන තීරණ ගන්නා අය මුලින්ම කී අදහස් ඉදිරිපත් කරමින් බුදුදහම තුළ නැති ආත්මවාදයක් ඇති කිරීමට උත්සාහ දරති.

අප මෙතෙක් ඉදිරිපත් කළ කරුණුවලින් පැහැදිලි විය යුත්තේ බුදු දහම උගන්වන ත්‍රි ලක්‍ෂණ  ධර්මය කෙබඳු ද යන්න ය. නමුත් නූතනයේ සමහරු මේවා වැරදි ලෙස වටහා ගෙන විපර්යාස ගොඩ නගා ගෙන ඇත. ඔවුන්ට අනිත්‍ය දේ නිත්‍ය ලෙසත් , දුක සැප ලෙසත්, අනාත්මය ආත්ම ලෙසත් පෙනෙන බව පෙනේ. එසේ විපර්යාස ගොඩ නගා ගන්නා අය අභාග්‍යවන්තයින් පිරිසක් හැටියට දැක්විය හැක.

බුදුරජාණන් වහන්සේ මේ ලෝකයේ තිබෙන සියලුදේ එකතු කොට රවුමක් තුළට ගෙන ඇත. එය හඳුන්වන්නේ සංඛත ලෝකය හැටියටයි. එම රවුමට අයත් නොවන එකම තත්වය නිවන පමණී. නිවන හඳුන්වන්නේ අසංඛත තත්වයක් හැටියටයි. නිවනින් මෙපිට පවත්නා සියල්ල අසංඛතයෝය. ඒවා උපදියි. පවතිමින්

වෙනස් වෙයි. අවසානයේදී නැතිවී යයි. මෙයින් කියන්නේ සෙලෙවෙන ලෝකය තුළ නොසෙල්වෙන කිසිවක් නැති බවයි.

නමුත් නූතන සමාජය තුළ බොහෝ දෙනාට මේ විශ්වසාධාරණ අනිත්‍යතාවයේ පණිවිඩය අමතක වී තිබේ. ඔවුන් හැමවිටම අපේක්ෂා කරන්නේ වෙනස් වීමට නොව ස්ථිර පැවැත්මටයි. භෞතික හා මානව යන සියලු සම්පත්වල සදාකාලික පැවැත්ම අපේක්ෂා කරති.  බුදුන් වහන්සේ දේශනා කරන්නේ ඇස ආදී ඉඳුරන් අනිත්‍ය බවයි. ඒ නිසාම එම ඇස දුකකි. ඒ නිසාම එම ඇස් තුළ මමය, මාගේය කියා සින්නක්කර කර ගැනීමක් ඇතිකරගත නොහැක. තත්වය මෙසේ උවත් පසුගිය දිනෙක ගුවන් විදුලියෙන් මෙවැනි ගීතයක් ඇසුනි. ''ලියාගන්න සින්නක්කර දෙනවද මට ඔය ඇස් දෙක''මෙවැනි අදහස් වලින් පෙනී යන්නේ අනිත්‍ය වූ ඇස නිත්‍ය කොට ගෙන සින්නක්කර කර ගැනීමට පෙළඹී ඇති බවයි. තව ටික දිනකින් මෙසේ ද ඇසෙන්නට පුළුවන. ලියාගන්න සින්නක්කර දෙනවද මට ඔය කන් දෙක . මෙවැනි අදහස් ඇසෙන විටම මතක තබාගත යුත්තේ ඔවුන් චංචල ලෝකය තුළ නිශ්චල නිගමනවලට බැස ඇති බවයි. අන්තිමේදී ඔවුන් මේ චින්තනය වෙනස්කර නොගෙන ජීවත්වුවහොත් මිය යන්නේ අභාග්‍යවන්ත පිරිසක් ලෙසටයි. මේවා බෞද්ධ අපට නොගැළපෙන දේ යැයි අවබෝධකර ගත හොත් ඔවුන් භාග්‍යවන්තයින් හැටියට දැක්විය හැක. එවිට ඔහු ඇස අනිත්‍ය බවත් දුක් බවත් අනාත්ම බවත් අවබෝධ කරගෙන ඒ ගැන කළකිරී සැපත උදාකර ගනී.

ඩබ්ලිව් . ඩී. අමරදේව මහතා ගායනා කරන ''සන්නාලියනේ'' ගීතය අප සඳහන් කරන විශ්ව සාධාරණ අනිත්‍යතාවය ඉතා හොඳින් විවරණය කරන ගීතයකි. ඉතා ලස්සනට කුඩා ඇඳුමක් මසන්නේ කාටද කියා ඇසුවිට දෙන පිළිතුර ඊයේ ඉපදුන චූටි දුවට බවයි. හැඩ වැඩ දමා වියන ඇඳුම

කාටද කියා අසන දෙවන ප්‍රශ්නයට පිළිතුර ඒ චුටි දුව දීගෙක දීම සඳහා බවයි. කණකොක් සුදු පාටින් යුක්ත ඇඳුම වියන්නේ කාටද කියා අසන තෙවන ප්‍රශ්නයට පිළිතුර විවාහකර දුන් දුවගේ මළ මිනිය වසන්නට බවය. බුදුදහම උගන්වන විශ්ව සාධාරණ අනිත්‍යතාවය ඉතා මැනවින් ප්‍රකට වන ගීතයක් හැටියට එය දැක්විය හැක.

නමුත් බොහෝ දෙනාට මේ බව අමතක වී ඇත. එදා බුදුරජාණන් වහන්සේ අද වැනි පෝය දිනක නාග දීපයට වැඩියේ දරුණු අදහස් ඇති අය මැණික් පුටුවක් අයිතිකර ගැනීමට කළ අරගලයක් විසඳීම සඳහායි. මේ දිනවලත් අපේ රටේ බොහෝ දෙනා ලී පුටුවක් සඳහා කරන අරගලවල නිමක් නැත. හැමදාම මම මේ පුටුවේ සිටිම් කියා යමෙකුට සිතේ නම් එයද ආත්මවාදී සිතුවිල්ලකි. එවැනි අය ජයග්‍රහණය ප්‍රාර්ථනා කරති. පැරදුනොත් ජීවිතයෙන් සමුගැනීමටද සිතති. බුදු දහම උගන්වන අටලෝ දහමේ හොඳ පැත්තක් මෙන්ම නරක පැත්තක්ද ඇත. හැමදාම හොඳවත්, නරකවත් ලැබෙන්නේ නැත. අද ලාභ ලබන්නාට හෙට අලාභ වේ. ලෝකය චංචලය කියා කියන්නේ ඒ නිසාය. එබැවින් බුදු දහම උගන්වන විදර්ශනා ප්‍රඥාව නැමැති ත්‍රිලක්ෂණය සිත් හි දරාගෙන ලෝකය චංචල බව තේරුම් ගෙන නිශ්චල නිගමනවලින් ඈත්වී භාග්‍යවන්තයින් ලෙස ජීවත් වීමට අදිටන් කර ගනිමු. බුදුන් වහන්සේ අද වැනි පෝය දිනක ශ්‍රී ලංකාවට වැඩම කළේ ඒ පණිවිඩය අපට ලබා දීමටයි.